# TWO PREHISTORIC SCULPUTURE FROM SRI LANKA

Anjalee Wickramasinghe[1]

**Abstract**

It is conventionally accepted that the earliest examples of three-dimensional images in Sri Lanka date back to the early centuries of the first millennium CE. The Buddha statues are considered the earliest sculptures ever made in the country. The archaeological fieldwork of the last five decades has expanded the chronological boundaries of the history of image-making in Sri Lanka. This article reviews two such three-dimensional figures of prehistoric origin. The sculptures discussed were recovered from the area around the central highlands.

**Keywords:** Image making, Prehistoric art

[1] Senior Lecturer, Department of Sinhala, University of Kelaniya

Email: anjaleew@kln.ac.lk https://orcid.org/0009-0007-8905-4097

Accepted the revised version: 01 December 2023. This work is licensed under C BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික යුගයට අයත් මූර්ති දෙකක්


## සාරසංක්ෂේපය

දෘඪ හෝ නම්‍යශීලී මාධ්‍යයක් භාවිතයෙන් ත්‍රිමාණ රූපයක් නිර්මාණය කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ පැරණිතම නිදසුන් වාර්තාවනුයේ බුද්ධ ප්‍රතිමා නෙලීමට සමගාමීව බව අප අතර තිබෙන සම්මත පිළිගැනීමයි. කාලය සහ කර්තෘත්වය පිළිබඳ පොදු එකඟතාවකට පැමිණීම දුෂ්කර වුවත්, ක්‍රිස්තුවර්ෂයෙන් ආරම්භක සියවස් කිහිපය තුළ බුද්ධප්‍රතිමාවක් බිහිවන්නට ඇතැයි සැලකේ. එහෙත් පසුගිය දශක පහකට ආසන්න කාලය තුළ මෙරට සිදු කර තිබෙන පුරාවිද්‍යාත්මක ක්ෂෙත්‍ර පර්යේෂණ මගින් ත්‍රිමාණ රූප නිමැවීමේ උත්සාහය පිළිබඳ ඉතිහාසයේ සීමා ප්‍රාග්ඓතිහාසික යුගය දක්වා පුළුල් කර තිබේ. මෙම ලිපිය ප්‍රාග්ඓතිහාසික සම්භවයක් ඇති එවැනි ත්‍රිමාන රූකම් කිහිපයක් පිළිබඳ සාකච්ඡාවක් ඉදිරිපත් කිරීමට නියමිතය.


**ප්‍රමුඛ පදඃ** ත්‍රිමාණ රූප, ප්‍රාග්ඓතිහාසික කලාව, මූර්ති නිර්මාණය

**සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික යුගය අදින් වසර 125000ක අතීතයකට කාල නිර්ණය කර තිබේ. එතැන් පටන් ක්‍රිස්තු පූර්ව 1800 දක්වා එම සංස්කෘතිය අඛණ්ඩව පැවතිණි (Deraniyagala, 1992). මෙකී දීර්ඝ කාල පරිච්ඡේදයේ ආරම්භක අවධිය ඉහළ පුරාශිලා යුගය (Upper Paleolithic period) නමින් හැඳින්වෙන අතර එසමයට අයත් රළු ගල්මෙවලම් මගින් එම අවධිය නිරූපණය වෙයි. අවම වශයෙන් මීට වසර 48000කින් මෙපිට යුගය මධ්‍යශිලා අවධිය වශයෙන් (Mesolithic period) හැඳින්වෙන අතර, තාක්ෂණික වශයෙන් කුඩා ප්‍රමාණයේ ගල්මෙවලම් නිපදවෙන කාල පරිච්ඡේදය එමගින් නිරූපණය වෙයි. ශ්‍රී ලංකාවේ මධ්‍යශිලා යුගයේ අවසන් කොටස, එනම්, ක්‍රිස්තු පූර්ව 1000න් පසු ක්‍රිස්තු පූර්ව 1800 තෙක් දිවෙන අවධිය, තාක්ෂණික-සංස්කෘතික වශයෙන් සැලකිය යුතු විවිධතා පෙන්නුම් කරන බව පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍යවලින් සනාථ වෙයි (Somadeva et al., 2018). දේශගුණික තත්ත්ව වෙනස්වීම් සහ ඊට සමාන්තරව ප්‍රාග්ඓතිහාසික ජනරේඛනයේ (demography) ඇති වූ ප්‍රසාරණය සේම ආහාර රටාවේ ඇති වූ නව්‍ය ජනනය ආදි බහුවිධ කාරණා මෙකී විවිධතාවලට හේතු වූ බවට අනුමාන කළ හැකිය.

ප්ලයිස්ටෝසීන භූ යුගය අවසන් වීමෙන් අනතුරුව ලෝකයේ ඇති වූ උණුසුම් හොලෝසීන කාලගුණික තත්ත්වය ශ්‍රී ලංකාව අත්දකින ලද්දේ වියළි සහ තෙත් සහිත කෙටි දේශගුණික අන්තර කිහිපයක් මගිනි (Singh, 1971; Premathilake, 2003). ආහාරයට ගත හැකි තෘණ විශේෂ ස්වාභාවිකව ප්‍රචලිත වීම කෙරෙහි මෙම දේශගුණික දෝලන අවකාශ සලසන ලද ආකාරය පුරා උද්භිද විද්‍යාඥයෝ පෙන්වා දෙති (Premathilake & Risberg, 2003). මේ අන්දමේ ස්වාභාවික සංචලන හේතුවෙන් සාම්ප්‍රදායික දඩකරු අන්නගවේෂී යැපීම් ආර්ථිකය (hunter-gatherer subsistence economy) වෙනුවට ඊට වඩා සුරක්ෂිත නව යැපීම් මාර්ග වෙත නැඹුරු වීමට ප්‍රාග්ඓතිහාසික කණ්ඩායම්වලට අවකාශ සැලසිණි. මේ පිළිබඳ විද්‍යමාන නිශ්චිත සාක්ෂ්‍ය වනුයේ දොරවකකන්ද ගල්ලෙන කැණීමෙන් පුරාවිද්‍යාඥයින් අනාවරණය කර තිබෙන අවශේෂයි. ඇතුළත එක් බිත්තියක කුරුටුරූප සටහන් කර තිබෙන එම ලෙනේ (Somadeva, 2012) පොළව කැණීමෙන් ධාන්‍ය අවශේෂ (කුරක්කන් (*Elusine coracana*) යැයි සැක කරන) සහ වළං කැබලිති සොයා ගෙන තිබේ. එම අවශේෂ ක්‍රිස්තු පූර්ව 4000ට කාලනිර්ණය වී තිබීම ඔස්සේ අවම වශයෙන් පසුගිය වසර 6000කට ඉහතදී මෙරට ප්‍රාග්ඓතිහාසික වැසියන්ගේ ජීවිතය ඊට පෙර යුගයට සාපේක්ෂව පරිවර්තනයකට ලක්වෙමින් පැවති අයුරු පෙන්වා දෙයි. දඩයමින් ජීවිකාව ගත කිරීම වෙනුවට ස්ථිරවාසීතාවට (sedentism) එළඹීමේ සහ කෘෂිකර්මාන්තයට යොමුවූ බවට අනුමාන කිරීම සඳහා ඉහත සාක්ෂ්‍ය සාධක වෙයි.

**ප්‍රාග්ඓතිහාසික මූර්ති**

මෙම ලිපියට පාදක වී තිබෙන මූර්ති නිදර්ශන ද්වය ස්තර අනුපිළිවෙළ අනුගමනය කළ පුරාවිද්‍යාත්මක කැණීම්වලින් සොයා ගන්නා ලද ඒවාය. (Somadeva et al., 2018) ඒවා බලංගොඩ ඉලුක්කුඹුරේ

මැද්දකන්ද අළුගල්ගේ නම් පර්වත ආවරණය කැණීමෙන් සොයා ගනු ලැබූයේ 2017 වසරේ සිදුකරන ලද දෙවන කැණීම් ව්‍යාපෘතිය මගිනි.

**සුනඛ හිස**

අළුගල්ගේ තුන්වන ස්තරය කැණීමෙන් මතුපිට තුනී හුණුගල් සායමක් ආලේපිත ටෙරාකොටා සුනඛ හිසක මූර්තියක් අනාවරණය කරගෙන තිබේ. ප්‍රාග්ඓතිහාසික අවධියේ සුනඛයන් (*Canis lupus familiaris*) සිටි බවට ලැබෙන තොරතුරු අල්ප වන නමුත් වසර 6500කට පූර්ව බවට කාලනිර්ණිත බලංගොඩ බෙල්ලන්බැඳි පැලැස්ස ගුහාවෙන් ද අම්පාර නිල්ගල ගුහාවෙන් ද සුනඛ ඇටසැකිලි හමුවී ඇත. (Deraniyagala, 1992). නූතන සුනඛයන්ගේ මයිටොකොන්ඩ්‍රියල් සහ Y වර්ණදේහ පිළිබඳ ගෝලීය පරිමාණ අධ්‍යයනයකින් උන්ගේ නැගෙනහිර ආසියානු සම්භවය පිළිබඳ සාක්ෂ්‍ය සැපයේ. (Savolainen et. al., 2002; Ding et. al., 2012). එම කලාපයේ සුනඛයන්ගේ ගෘහස්ථකරණය සිදුව ඇත්තේ ක්‍රි.පූ. 14000 - 9000 අතර කාලයේදීය (Freedman et. al., 2014).

බලංගොඩ ඉළුක්කුඹුර මැද්දකන්දේ අළුගල්ගෙයින් සොයා ගන්නා ලද මෙම සුනඛ මූර්තිය ස්වභාවවාදී ප්‍රකාශනයකි. සෙන්ටිමීටර 8ක උසකින් යුත් එය, තෙත් මැටිපිඬක තිබෙන ලිහිල් ප්‍රත්‍යස්ථතාව සැලකිල්ලට ගනිමින්, තමන්ට අභිමත සමෝච්ඡ රේඛා නිර්මාණයට දකුණතේ මහපට ඇඟිල්ල උපයෝගී කරගනිමින් නිර්මිත නිදහස් නිර්මාණයක ස්වභාවය පෙන්වන්නකි. එක් අතක මහපට ඇඟිල්ලේ සලකුණු පමණක් මූර්තිය මත දක්නට ලැබීමෙන් එය වම් අත මත තබා ගත් මැටිපිඬක් මත දකුණතින් හැඩය ආරෝපණය කළ ආකාරය පැහැදිලි කරයි. තමන් දුටු, එහෙත් ඒ වන විටත් පරිකල්පනයේ රැඳුණු ස්වාභාවික රූපයක් ස්වීය හැඟීම් සමග මුසු කරමින් නිරූපණය කරන්නට එය නිමැවූ පුද්ගලයා සතුව පැවති ශික්ෂණය සහ නම්‍යශීලිත්වය මෙම මූර්තියෙන් ප්‍රකට වෙයි.



**ඡායාරූප අංක 1** බලංගොඩ අළුගල්ගෙයින් පුරාවිද්‍යාඥයින් විසින් සොයා ගන්නා ලද ස්වාභාවික මූර්ති නිදර්ශනයක්. (ඡායාරූපය, රාජ් සෝමදේව)

අභිනවයෙන් හඳුනාගන්නට ලැබුණු, මිනිසාට ළැදි මේ අපූරු සත්ත්වයාගේ ඇඟෑලුම් බව නිසා හටගත් ආහ්ලාදය හෝ එවැන්නකුගේ වියෝවෙන් හටගත් චිත්ත වික්ෂෝභය මෙවැනි මූර්තියක් නිමැවීමට

කෙනෙකු පෙලඹවිය හැකිය. මූර්තිය මත ආලේප කරන ලද සුදුපැහැති හුණු ස්තරය, අතිශයින් සංකේතාත්මකය. සතුට හෝ වේවා දුක හෝ වේවා තමා විසින් නිර්මිත මූර්තියෙන් නිරූපිත ප්‍රකාශනය කෙරෙහි නිර්මාපකයාගේ ප්‍රසාද චිත්තයෙහි ජනිත සංවේගය ඉන් සංකේතවත් කරයි. ඉහතින් සඳහන් කළ පරිදි ගෘහාශ්‍රිත සුනඛයෙකුගේ අස්ථි කොටස් සොයා ගත් බෙල්ලන්බැඳිපැලැස්ස පිහිටා තිබෙනුයේ මෙම සුනඛ මූර්තිය සොයා ගත් ගල්ලෙනේ සිට කිලෝමීටර 3ක පමණ දුරකිනි. ආසන්න වටපිටාවක ගැවසුණු සත්ත්වයෙකු නිසා සිතක හටගන්නා සංවේදනය බාහිර ද්‍රව්‍යයක් මත පරිකල්පනාත්මකව පතිත කරවීමට ප්‍රාග්ඓතිහාසික මිනිසා තුළ පැවති කුසලතාව ක්‍රිස්තු පූර්ව 3950දී නිමවන ලද මෙම මූර්තියෙන් ප්‍රතීයමාන වෙයි.

**ශෛලමය මූර්තිය**

මෙම නිරූපණය තිරිවානා ගලකින් සැදුම් ලද්දකි. එය කාලයක් පුරා දියපහරකට හසුවීමෙන් රවුම් හැඩයක් ගෙන ඇති බව පැහැදිලිය. මතුපිටට දිස්වන රතු පැහැයට සමීප වර්ණය එම පාෂාණයෙහි අන්තර්ගත යකඩ මිශ්‍රිත කිසියම් ඛනිජයක් නිසා හට ගැණුනකි. මෙම වෘත්තාකාර තිරිවානා ගල සෙන්ටිමීටර 7ක විෂ්කම්භයකින් යුක්තය. සොයා ගෙන තිබෙන්නේ අළුගල්ගේ ගුහාවේ ඇතුළත පොළව කැණීමෙනි. ජල මූලාශ්‍රයකින් හට ගන්නා මෙවැනි තිරිවානා ගලක් ගල්ලෙනක හමුවීමෙන් පළමුව පැහැදිලි වන කරුණක් වන්නේ, එය කිසියම් අපේක්ෂාවකින් එම ස්ථානය වෙත රැගෙන එන ලද්දක් වන බවයි.

මෙම තිරිවානාගල මිනිස් මුහුණක පිළිබිඹුවකි. එය වඩාත් සමීපවනුයේ කුඩා දරුවකුගේ විරූපී වූ මුහුණකටය. එය ස්වාභාවිකව හැඩගැන්වුණු නිදර්ශනයකි. එවැනි දේ හඳුන්වනුයේ *ස්වාභාවිකජ වස්තු* (naturegenic objects) යන යෙදුමෙනි. මිනිසා මෙවැනි දේ සමග සබඳතා පැවැත්වීම ආරම්භ කරන ලද්දේ මීට වසර තිස්ලක්ෂයකට (3000000) පමණ ඈත කාල පරිච්ඡේදයක සිටය. ඔස්ට්‍රලෝපිතිකස් ඇෆ්‍රිකානුස් විසින් ආශ්‍රයට ගන්නා ලද මෙවැනි නිදර්ශනයක් කීර්තිමත් මානවවිද්‍යාඥයෙකු වූ රේමන්ඩ් ඩාර්ට් විසින් 1952 වසරේදී අප්‍රිකාවේ මකපන්ස්ගාත් නම් ගල්ලෙනේ තිබී සොයා ගන්නා ලදී (Bednarik,1998). මෙම නිරූපණය හඳුන්වනුයේ මකපන්සගාත් තිරිවානා ගල (Makapansgat pebble) යන වහරිනි. මකපන්සගාත් තිරිවානාල ගල සහ අළුගල්ගේ තිරිවානා ගල යන දෙකම මිනිස් මුහුණක් පිළිබිඹු කරන නිදර්ශනයි.



**ඡායාරූප අංක 2** බලංගොඩ අළුගල්ගෙයින් පුරාවිද්‍යාඥයින් විසින් සොයා ගන්නා ලද ස්වභාවිකජ මූර්ති නිදර්ශනයක්. (ඡායාරූපය, රාජ් සෝමදේව)



**ඡායාරූප අංක 3.** මකපන්ස්ගාත් පාෂාණය. වසර ලක්ෂ 3000000ක් පැරණි මෙම පාෂාණය 1925 වසරේදී දකුණු අප්‍රිකාවෙන් සොයා ගන්නා ලද්දකි.

විරූපී කුඩා දරුවකුගේ මුහුණක් නිරූපණය කරන වස්තුවක් තමන් සන්තකයේ තබා ගැනීම ප්‍රායෝගික අවශ්‍යතාවකට වඩා මානසික අවශ්‍යතාවක් සපුරාලීමකට සමීප විය හැකිය. ප්‍රාග්ඓතිහාසික යුගයේ පටන් මිනිසුන් සිය සිතිවිලි, සංවේදන, ගැටුම්, කාංසාවන් බඳු භාව විමෝචනය උදෙසා ද්‍රව්‍ය භාවිතයෙන් වෑයම් කරන අයුරු කබෙකා (Cabeca, 2020) විසින් පෙන්වා දෙනු ලැබ ඇත. විරූපි දරුවකු ඉපදීමෙන් දෙමව්පියන් තුළ හටගන්නා හැඟීම ක්ෂණික තැති ගැන්මක් සහ ඒ සමඟම ඇති වන භග්නාපේක්ෂාවෙන් හටගත් කාංසාවකින් යුක්ත විය හැකිය. උපතේදීම විරූපීව පිළිසිඳෙන දරුවෝ කෙටි කලකදී මියයති. එමගින් ජීවත්වන්නා තුළ ඇතිවන තැතිගැන්ම තවදුරටත් තීව්‍ර වෙයි. විරූපී මුහුණක් සහිත දරුවන් ඉපදීම ජානමය විකෘතිතාවක් නිසා ඇති වන්නකි. එම තත්ත්වය වෛද්‍ය විද්‍යාවේ හඳුන්වනු ලබනුයේ ට්‍රීච(ර්) කොලින්ස් ව්‍යාධිය (Treacher Collins syndrome) යන නමිනි (Splendore et al., 2003).

විකෘති දරුවකු බිහිවීමත් නොබෝ වේලාවකින් ඔහු හෝ ඇය අභිමිවීමත් පුද්ගලයෙකුගේ සිතේ ඇති කරවන තැතිගැන්ම කලකදී පහව ගියද එවැනි විකෘතිතාවක් සිහිගන්වන ද්‍රව්‍යමය වස්තුවක් දැකීමෙන් නැවතත් ඒ පිළිබඳ මතකය සිහිගැන්වීම නොවැළැක්විය හැකි දෙයකි. එවැනි අත්දැකීමකට මුහුණ දුන් අළුගල්ගේ ජීවත් වූ පුද්ගලයකු මෙම ස්වභාවජ තිරිවානාගල තම වාසස්ථානයට රැගෙන එන්නට ඇත. මෙම පාෂාණය සතු කරගත් තැනැත්තාට එය මතකාවර්ජනයකට සාධකයක් වුවත්, කලාවේදීන් හට එම වස්තුවම කලාකෘතියක් බවට පත්ව ඇති සෙයකි. කලාත්මක දෘෂ්ටිය සහ එය මනෝමූලික සංකල්පයකට ආරෝපණය කරගැනීම සෞන්දර්යාත්මක හැඟීම් ඇත්තවුන්ගෙන් ප්‍රතීයමාන වන්නකි. ප්‍රාග්ඓතිහාසික මානවයා සතුව පැවති කලා විඥානය විශද කිරීමට පූර්වෝක්ත ශෛලමය මූර්තිය නිදර්ශනයක් වෙයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

Bednarik, R. (1998). The 'Australopithecine' Cobble from Makapansgat, South Africa. *The South African Archaeological Bulletin* 53(167)

Cabeça, P.T. (2020). Antologia de Ensaios LABORATORIO COLABORATIVO: Dinâmicas Urbanas,Património Artes. VI Seminário de Investigação, Ensino e Difusão. Publisher: DINÂMIA'CET-ISCTE. p 295.

Deraniyagala, S. (1992). The Prehistory of Sri Lanka. Department of Archaeological Survey

Ding, Z., Oskarsson, M., Ardalan, A., Angleby,H, Dahlgren, L. et al., (2012). Origins of domestic dog in Southern East Asia is supported by analysis by Y-chromosome DNA. *Heredity*, 108(5), 507-514

Freedman, A, Gronau, I., Schweizer, R., Ortega-Del Vecchyo, D. et al., (2014). Genome sequencing highlights the dynamic early history of dogs. *PLoS Genetics* 10(1): e1004016

Premathilake, R. (2003). Holocene plaeoecological records of climatic and human impact on vegetation in the Horton Plains, Sri Lanka. In: Late Quaternary Palaeoecological Event Stratigraphy in the Horton Plains, Central Sri Lanka. Thesis in Quaternary Geology by Premathilake, R. Paper V. Stockholm University

Premathilake, R., J. Risberg. (2003). Late Quaternary climate history of the Horton Plains, central Sri Lanka. *Quaternary Science Review* 22: 152-154

Savolainen, P., Zang, Y. Lunderberg, J., Leitner, T. (2002). Genetic evidence for an East Asian origin of domestic dogs. *Science* 298(5598): 12387-12390

Singh, G. (1971). The Indus Valley Culture. *Archaeology and Physical Anthropology in Oceania* 6(2), 177-189

Somadeva, R. (2012). *Rock Paintings and Engraving Sites in Sri Lanka*. Postgraduate Institute of Archaeology

Somadeva, R., Abeysiriwardhana A. C. (2018). Cultural Dynamism of prehistoric Hunter-gatherers in mid/late Holocene Sri Lanka. In The Resilience of Heritage Cultivating a Future of the Past In the Essays in honor of Professor J.J. Paul Sinclair. (Ekbohlm , A., Ishendhal, C. K.J. Lingholm eds.), 2018, Uppsala University.

Splendore, A., Felix E.W. T.M.., PassÈ-Bueno., M. R (2003). Parental origin of mutations in sporadic cases of Treacher Collins syndrome *European Journal of Human Genetics*, 11, 718–722